මෙයයි. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පනත යටතේ සිදු කරන ලද, ඒකට ගැනෙන ඕනෑම වරදක් වර්තමාන පනත යටතේත් වරදක් විධියට සැලකෙනවා. හැබැයි, ඒ වැරැදිවලට අමතරව අලුතින් හඳුන්වා දීපු වරදක් සම්බන්ධව තමයි මෙම පනත බලාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වෙන්නේ. අල්ලස හෝ දූෂණය කියන එක සම්බන්ධයෙන් අපේ රටේ පවතින සාමාන්‍ය නීතිය තමයි අවුරුදු 20ක් ඇතුළත එවැනි දෙයක් සිදුවෙලා තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගන්න පුළුවන් කියන එක. ඒ අනුව අල්ලස හෝ දූෂණය අවුරුදු 20ක් ඇතුළත සිද්ධවෙලා තිබෙනවා නම් මෙම පනත යටතේ නීතිමය පියවර ගන්න කිසිම ගැටලුවක් නැහැ. ගරු ඩිලාන් පෙරේරා මැතිතුමා මීට කලින් මෙම පනතේ 109වන වගන්තිය සම්බන්ධයෙන් මතු කරපු වෙලාවේදීත් මම සඳහන් කළා, ඒ වගන්තිය යටතේ පවා අවුරුදු 20ක අතීතයකට මේ නීති ක්‍රියාත්මක වෙනවා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විපක්ෂ නායකතුමා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe, PC)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. HESHA WITHANAGE took the Chair.*

[අ.භා. 3.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව කරුණු කාරණා ගණනාවක් සාකච්ඡාවට භාජන වෙන අද දවසේ විශේෂයෙන්ම පාසල් යුගයේ රාජකීය විද්‍යාලයේත්, මිල්හිල් විද්‍යාලයේත් වසර ගණනාවක් ක්‍රීඩා කරපු ක්‍රිකට් ක්‍රීඩකයෙකු හැටියට මම දැඩි ලෙස කනගාටු වෙනවා, පසුගිය කාලය පුරාවටම අපේ ක්‍රිකට් ක්‍රීඩාවට අත්පත් වී තිබෙන ඉරණම පිළිබඳව. එය ඉතා ශෝචනීයයි වාගේම ඛේදජනකයි. මහා ඛේදනීය තත්ත්වයක් ක්‍රිකට් ක්‍රීඩාව තුළ අද වෙනකොට නිර්මාණයවෙලා තිබෙනවා. මොකක්ද මේකට ප්‍රධානතම හේතුව? මම හැම විටම ප්‍රකාශ කරපු අදහසක් තමයි මේ ක්‍රිකට් ක්‍රීඩාව තුළ ඉතා ඉහළ දේශපාලනීකරණයක් තිබෙනවා කියන එක. මේ දේශපාලනීකරණය දෙයාකාරයි. එක පැත්තකින්, ආයතනික දේශපාලනය - institutional politics - තිබෙනවා. තවත් පැත්තකින්, සම්ප්‍රදායානුකූල දේශපාලනය තිබෙනවා. මේ දෙකම එකට එකතුවෙලා, -විශේෂයෙන්ම ආනා පුංචිහේවා මැතිතුමාගේ කාල වකවානුවෙන් පස්සේ- බොහෝ අවස්ථාවලදී මේ දේශපාලනීකරණය, දේශපාලන ඇඟිලි ගැසීම් සිදු වෙන බව අවුරුදු ගණනාවක් මුළුල්ලේ මම කියනවා. ඒ වාගේම ක්‍රිකට් ආයතන ක්‍රියාත්මක වෙන්නේ තනි බලඅධිකාරියක් හැටියටයි.

කාලයෙන් කාලයට ව්‍යාපාරික මාෆියා එකට එකතු වෙලා, නිලවරණ ක්‍රමය set කරලා, තට්ටු මාරු ක්‍රමයට තමන්ගේ බල පුළුවන්කාරකම් තුළ බලය ලබා ගන්නවා. මෙන්න මේ ආයතනික දේශපාලනය - institutional politics - සහ සම්ප්‍රදායානුකූල දේශපාලනය - traditional politics - නිසා ක්‍රිකට් ක්‍රීඩාව අද සම්පූර්ණයෙන්ම පහළ මට්ටමකට වැටී තිබෙන තත්ත්වයක් අපට පෙනෙනවා. ඒ නිසා අවිවාදයෙන්ම අපි කියන්නට ඕනෑ, ඒකේ වෙනසක් වෙන්නට ඕනෑ බව. අලුත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ග්‍රාමීය මට්ටමේ ඉඳලා ඈත එපිට ගම්වල, නගරවල හැම මට්ටමකම හැකියාව, දක්ෂතාව, කුසලතාව තිබෙන ක්‍රිකට් ක්‍රීඩකයින්ට ඉහළට යන්නට ක්‍රමයක් සකස් කරන්නට ඕනෑ. අපේ රටේ cricket structure එකක් නැහැ. පාසල් ක්‍රිකට් ක්‍රීඩාවේ ඉඳලා හරියාකාර වැඩ පිළිවෙළක් නැහැ. දේශපාලන අතපෙවීම් නිසා අද favoritism ක්‍රියාත්මක වෙනවා. විවිධ දේශපාලනඥයන්ගේ ඕනෑ එපාකම්වලට, ඉතිහාසයේ යම් යම් අවස්ථාවලදී ක්‍රිකට් ක්‍රීඩකයින් තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සිදු වෙලා තිබෙනවා. මෙහෙම අපට යන්නට බැහැ. ඒකේ බරපතළ වෙනසක් වෙන්නට ඕනෑ. ඒ වෙනස ඇති කිරීමේ ක්‍රියාදාමය ගැන සාකච්ඡා කරනකොට මම විශ්වාස කරන විධියට අපට වැදගත් වෙනවා, ලෝකයේ සාර්ථකව ක්‍රිකට් පරිපාලනය, ක්‍රිකට් ක්‍රීඩාව ක්‍රියාත්මක කරන රටවල් පිළිබඳව හොඳ අධ්‍යයනයක් කරන එක. කවුද role modelsලා, මොන රටවලද ක්‍රිකට් පරිපාලනය දේශපාලන අතපෙවීම්වලින් තොරව ක්‍රියාත්මක වෙන්නේ, විවිධ මහා පරිමාණ ව්‍යාපාරික අවශ්‍යතා මත ක්‍රිකට් ක්‍රීඩාවේ බලය අතට ගන්නවා වෙනුවට, කොහොමද විනිවිදභාවයෙන් යුක්තව මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන්නේ කියලා අධ්‍යයනයක් කළ යුතුයි.

ක්‍රිකට් ක්‍රීඩාව ගැන සාකච්ඡා කරන මේ මොහොතේ අපි මතක් කරන්නට ඕනෑ, දිවංගත ගාමිණී දිසානායක මැතිතුමා ගැන. එතුමා දරපු දැවැන්ත උත්සාහයක් තුළ අපේ රටට test cricket වරම් ලැබුණා. ඒ වාගේම ඒ ක්‍රියාවලියේ කවුරුත් සඳහන් නොකරන, ඒ කාලයේ ක්‍රිකට් ක්‍රීඩාවට ශක්තිය ලබා දුන්න චරිතයකුත් හිටියා. ඒ තමයි දිවංගත ආර්. රාජමහේන්ද්‍රන් මැතිතුමා. ඔහු "සිරස" නාලිකාවේ හිටපු හිමිකරු -අයිතිකරු- සහ කැපිටල් මහරාජා සමූහයේ හිටපු අයිතිකරු. ඒ අය ක්‍රිකට් ක්‍රීඩාවට උදවු කළේ මුදල් උපයන්න නොවෙයි. කවදාවත් ඒ අය ක්‍රිකට් ක්‍රීඩාවට අයිති මුදල්වලින් සුඛවිහරණය පැතුවේ නැහැ. අතේ තිබුණු තුට්ටු දෙකත් -සල්ලි ටිකත්- ක්‍රිකට් ක්‍රීඩාවට ලබා දුන්නා. ක්‍රීඩකයින්ව sponsor කළා. ආර්ථික මූල්‍ය ශක්තිය ලබා දුන්නා.

ඊළඟට, ආනා පුංචිහේවා මැතිතුමාගේ කාල වකවානුව මම හඳුන්වනවා ක්‍රිකට් ක්‍රීඩාවේ ස්වර්ණමය යුගය හැටියට. දැන් මේ ගරු සභාවට ඇවිල්ලා සමහර අය ආනා පුංචිහේවා මැතිතුමා ගැන බණ දේශනා කරනවා. ආනා පුංචිහේවා මැතිතුමා පරද්දන්න කටයුතු කළෙත් මේ මැතිසබයේ ඉන්න නියෝජිතයෝ කිහිපදෙනෙක්. ඉතින් මොන බොරු, ටොන් පව කථාද ඒ අය මේ කියන්නේ? දිව දෙකේ නොවෙයි, දිව හතේ කථා කියන්නේ. ආනා පුංචිහේවා මැතිතුමාට ඔය cricket clubsවල බලය, වෙන වෙන බලයන් තිබුණේ නැහැ. නමුත් ඔහුට තිබුණා වෘත්තීයවේදීත්වයක්; he is a professional. ඔහු ඉතාම වෘත්තීයවේදී ආකාරයට - professional ආකාරයට - ඒ කටයුතු

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කළා. හැබැයි, එයින් පස්සේ ගජමිතුරු ධනවාදී ව්‍යාපාර කල්ලි තට්ටු මාරු ක්‍රමයට මේ ක්‍රිකට් ක්‍රීඩාව තමන්ගේ පෞද්ගලික බුදලය බවට පත් කරන්නට කටයුතු කිරීම නිසා තමයි අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ පරිහානිය ඇති වුණේ.

ඒ නිසා ක්‍රිකට් පරිපාලනය වඩාත් ප්‍රශස්තව, ප්‍රබුද්ධව ක්‍රියාත්මක වන ලෝකයේ රටවල් පිළිබඳව වහාම හොඳ අධ්‍යයනයක් කරන්නට ඕනෑ. ඒ වාගේම ක්‍රිකට් සංවර්ධනය - cricket development - සිදු කිරීමේදී පාසල් මට්ටමේ ඉඳලා පමණක් නොවෙයි, ඊට පහළ මට්ටමේ -පොඩි කාලයේ, කුඩා කාලයේ- ඉඳලා වුණත් දුවා-දරුවන්ට ඒ නිපුණතාව, ඒ කුසලතාව ලබා දෙන වැඩ පිළිවෙළ අපි ක්‍රියාත්මක කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අපට අහන්න ලැබෙනවා ක්‍රිකට් ක්‍රීඩාවේ ශක්තිය තුළින්, අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ ක්‍රියාකාරිත්වය තුළින් උපයා ගත් මිලියන ගණන්, බිලියන ගණන් වන මුදල් අයථා ක්‍රියාදාමවලට වියදම් කරන බව. ඒවා ගම්වලින් බිහිවන ක්‍රිකට් ක්‍රීඩකයින්ට, ඒ පිපෙන මල්වලට වෙන් කරන්න තිබෙන සල්ලි නේද? ඒ අරමුදල් බිමට, ක්ෂේත්‍රයට, පහළ මට්ටමට යනවා වෙනුවට අගනුවර කේන්ද්‍ර කරගත් බල අධිකාරියක් තුළින් තමන්ගේ පෞද්ගලික සුඛවිහරණය උදෙසා, සාත්තු සප්පායම් කර ගැනීම සඳහා උපයෝගි කර ගැනීම බොහොම ඛේදනීය තත්ත්වයක්; කනගාටුදායක තත්ත්වයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සක්වල" බස්රථ වැඩසටහන, තොරතුරු තාක්ෂණ වැඩසටහන ක්‍රියාත්මක කරන්නට යනකොට අපි දකිනවා, ක්‍රිකට් ක්‍රීඩාව ඉතා හොඳින් හදාරා ඉදිරියට යැමට ඒ පාසල්වල දූ දරුවන් තුළ ලොකු ආශාවක් තිබෙන බව. සමහර පාසල්වල ක්‍රිකට් ක්‍රීඩාව ඉගැන්වීම සඳහා ගුරුවරු නැහැ. සමහර පාසල්වල ඒ ගුරුවරුන්ගේ වේතනය, දීමනාව ලබා දෙන්නේ දෙමව්පියන් එකතු වෙලා. ඒ අයට nets නැහැ; pitch එකට අවශ්‍ය matting එක නැහැ; ක්‍රීඩාංගණ නැහැ. මදක් හිතා බලන්න, මේ ක්‍රිකට් ක්‍රීඩාව තුළින් අපේ රට උපයන මේ මහා ධනස්කන්ධය පිළිවෙළකට, ක්‍රමානුකූලව රටේ පාසල් පද්ධතියට සහ රට තුළ තිබෙන තවත් ක්‍රිකට් කේන්ද්‍රීය ව්‍යුහයන් හරහා විය පැහැදම් කරලා ඒ අවශ්‍ය පහසුකම් ලබා දුන්නා නම්, ඒ අවශ්‍ය මඟ පෙන්වීම සිදු කළා නම්, ඒ අවශ්‍ය මැදිහත්වීම සිදු කළා නම් අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව මීට වඩා ඉහළ මට්ටමකට එනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ තුළ පැහැදිලිවම බරපතළ වෙනසක් සිදු වෙන්නට ඕනෑ බව.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට අලුත් ව්‍යවස්ථාවක් අවශ්‍යයි. අලුත් ව්‍යවස්ථාවක් තුළ අලුත් නීති පද්ධතියක් තුළ මේ රටේ විධිමත් ක්‍රිකට් පරිපාලනයක් ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. පළමුවෙනි කාරණය තමයි නිර්දේශපාලනීකරණය. එක පැත්තකින් දේශපාලන ඇඟිලි ගැසීම් නතර කිරීමත්, තවත් පැත්තකින් ආයතනික සහ බලවත් ව්‍යාපාරික පවුල්වල මැදිහත්වීම නතර කිරීමත්, අනෙක් පැත්තෙන් අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වීමත් අවශ්‍යයි. ඒ සඳහා අලුත් නීති රීති අවශ්‍යයි. තමන්ට ජනාධිපතිකමේ ඉන්න ඕනෑ වුණාම, පාර්ලිමේන්තු ස්වෛරීත්වය ගැන ඇති තරම් කයිය ගහනවා. පාර්ලිමේන්තුව ඇතුළට ඇවිල්ලා අධිකරණයටත් බලපෑම් කරනවා, වරප්‍රසාද ප්‍රශ්න එයි කියලා. හැබැයි, මේ රටේ ගම්බද, නගරබද තරුණ-තරුණියන්ට ක්‍රිකට් ක්‍රීඩාවට අවතීර්ණවීමට ලබා දී තිබෙන ඉඩකඩ අහිමි වෙනකොට මොකද වෙන්නේ? මේ බලපුළුවන්කාරයින්ට, මේ ධනවත් පවුල්වල ධනකුවේරයන්ට දේශපාලනඥයෝ යටත් වෙනවා. අපි වහාම මේ නිවටකමින් මිදෙන්නට ඕනෑ. අපි අලුත් අණපනත් මේ සභාව තුළ ගෙනෙන්නට ඕනෑ.

ඒ අලුත් අණ පනත් හරහා ක්‍රිකට් පිළිබඳ අලුත් ව්‍යුහයක්, අලුත් ක්‍රමවේදයක්, නිර්දේශපාලනීකරණයක්, විනිවිදභාවයක්, වෘත්තීයත්වයට මුල් තැනක් ලබා දීලා ක්‍රිකට් පරිපාලන වැඩ පිළිවෙළ professionalsලාට භාර දෙන්නට ඕනෑ. ඒක තමයි දිය හැකි එකම විසඳුම. ලෝකයේ අනෙකුත් රටවල බොහොම පැහැදිලි වැඩසටහන් තිබෙනවා. එංගලන්තය දිහා බැලුවොත්, school cricket තිබෙනවා; club cricket තිබෙනවා; county cricket තිබෙනවා; National Team එකට අදාළව ටෙස්ට් ක්‍රිකට් තිබෙනවා. ඕස්ට්‍රේලියාව දිහා බැලුවොත්, ඒ විවිධ ප්‍රදේශවල බිම් මට්ටමේ ඉඳලා ශක්තිමත් ව්‍යුහයක් - structure එකක්- තිබෙනවා. අපේ රටේ එහෙම නැහැ. අපේ රටේ එකම දෙයකට විතරයි ශක්තිමත් ව්‍යුහයක් තිබෙන්නේ. ධන බලයටයි, බලපුළුවන්කාරකම් බලයටයි, ව්‍යාපාරික බලයටයි, ගජ මිතුරන්ටයි, ගජමිතුරු හිතවතුන්ටයි, ගජ මිතුරු ධනවාදීන්ටයි එකතු වෙලා මේ ක්‍රිකට් කියන මැණික් ඉල්ලමේ සදාකාලික සින්නක්කර අයිතිකරුවන් බවට පත්වීමේ ක්‍රමවේදය විතරයි අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව තුළ අද නම් පෙනෙන්නට තිබෙන්නේ. මේක වහා වෙනස් කරන්නට ඕනෑ. ඒ සඳහා අපි දැවැන්ත ප්‍රතිසංස්කරණයකට යන්නට ඕනෑ. කිසිම පුද්ගලයෙකු ඉලක්ක කරගෙන මම මේ කතන්දර කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි අද දින සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙන ආවේ. අපි "සක්වල" වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යන කොට, අනේ! දරුවන් දුවගෙන ඇවිල්ලා අපෙන් ඉල්ලීම් කරනවා, "අපට mat එකක් නැහැ, අපට ක්‍රිකට් බඩු නැහැ" කියලා. එහෙම කියන කොට අපි Sri Lanka Cricket එකට ඒ ගැන කියනවා. ඒ වාගේම අප කියපු අවස්ථාවල Sri Lanka Cricket එකෙන් උදව් කරලාත් තිබෙනවා. නැහැ කියන්නේ නැහැ. හැබැයි, ඒක නොවෙයි ක්‍රිකට් සංවර්ධනය කියන්නේ. දේශපාලනඥයන් පාසලකට ගියාම දරුවන් දුවගෙන ඇවිත් කියන අඩු පාඩු සකස් කිරීම පමණක් නොවෙයි, මේ රටේ ක්‍රිකට් සංවර්ධනය කියන්නේ. ඊට වඩා මනා සංවිධායකත්වයකින් යුත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි; ක්‍රමවේදයක් අවශ්‍යයි. ඒක අපේ රටේ නැහැ. ඒක මහා ඛේදනීය තත්ත්වයක්. ඒ නිසා අපි මේ අවස්ථාවේ නව ප්‍රවේශයකට යන්න ඕනෑ.

මම ක්‍රීඩා ඇමතිතුමාට කියනවා, ජනාධිපතිවරයා, අගමැතිවරයා ඇතුළු කැබිනට් මණ්ඩලයේ කිසිම කෙනෙකුට යටත් වෙන්නේ නැතුව කොන්ද කෙළින් තියාගෙන, කශේරුකාව හොඳින් ශක්තිමත් කරගෙන මේ රටට අවශ්‍ය අලුත් අණ පනත් ගෙන එන්න කියලා. නිර්දේශපාලනීකරණයට ලක් වුණු, විනිවිදභාවයක් සහිත, ක්‍රිකට් හා සම්බන්ධ වෘත්තීය කළමනාකාරිත්වයක් - professional management එකක් - ඇති කිරීම වෙනුවෙන් ගෙන එන වැදගත් යෝජනාවලට, ප්‍රගතිශීලී, සාධනීය අලුත් අණ පනත්වලට සහයෝගය, ශක්තිය ලබා දෙන්න විපක්ෂයේ අපි සූදානම් කියන එක මම මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. අර tournament එක තිබෙනවා, මේ tournament එක තිබෙනවා, අපි ඒවායින් පස්සේ මේවාට ප්‍රවේශ වෙමු කියමින් එක එක හේතු දක්වන්න එපා. ඒවා අසත්‍ය කථා. ලෝකයේ අනෙකුත් රටවල් තාවකාලික විසඳුම්වලට ගිහින් තිබෙනවා. තාවකාලික විසඳුම්වලට යන්න මැළි වෙන්නට අවශ්‍ය නැහැ. අපි ඉල්ලා සිටිනවා, ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා අලුත්, ප්‍රශස්ත විසඳුමකට යමු කියලා. දැනට සිටින පරිපාලනයත්, පරිපාලනයේ හිටපු අයත් - ඒ හැමෝම - එකතු කරගෙන මේ ගමන යමු. ඒ වාගේම, විශේෂයෙන්ම මේ රටට විශිෂ්ට සේවාවක් කරපු අපේ වෘත්තීය ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ - professional cricketersලාගේ - හඬටත් හොඳ ඉඩක් දෙන්නට ඕනෑ; හොඳ අවකාශයක් දෙන්නට ඕනෑ. මොකද, ඔය පරිපාලනයේ ඉන්න අය නොවෙයි, ground එකට ගිහිල්ලා ක්‍රීඩා කරන්නේ.

ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමනි, මම මේ වෙලාවේ ආදරයෙන් මතක් කරනවා, තමුන්නාසේගේ සහෝදරයා වන අපේ අර්ජුන රණතුංග මැතිතුමා. එතුමා කීර්තිමත් නායකත්වයක් ලබා දීලා අපේ රටට World Cup එක දිනා දුන්නා. බලන්න, ඒක කොයි තරම් විශිෂ්ට ක්‍රියාවක්ද කියලා. අපි ඒක ප්‍රශංසාවට ලක් කරනවා. ඒ වාගේම අපි ප්‍රාර්ථනා කරනවා, මේ බල පුළුවන්කාරකම්වලින් හෙබි එක්තරා පුද්ගලයන් කොට්ඨාසයකගේ ඒකාධිකාරියට ලක් වුණු වැඩ පිළිවෙළට යන්නේ නැතුව අප යෝජනා කරන මේ අලුත් වැඩ පිළිවෙළ තුළ, අලුත් ව්‍යවස්ථාව තුළ, අලුත් ගමන තුළ විනිවිදභාවයෙන් යුක්ත වූ විශිෂ්ට වැඩ පිළිවෙළකට ප්‍රවේශ වන්නට සියලු දෙනාටම ධෛර්යය, ශක්තිය, වාසනාව ලැබේවා කියා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.04]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු ගණනාවක් තිස්සේ ක්‍රීඩාවට සම්බන්ධ වෙලා ඉන්න කෙනෙකු හැටියට මම මුලින්ම කියන්න ඕනෑ, මේ විවාදයට මා නම් සම්බන්ධ වෙන්නේ ෂම්මි සිල්වාට කඩේ යන්නවත්, රේන ද සිල්වාට කඩේ යන්නවත්, හිටපු ක්‍රිකට් සභාපතිවරයෙකුට කඩේ යන්නවත්, හිටපු ක්‍රිකට් නායකයෙකුට කඩේ යන්නවත්, රොෂාන් රණසිංහට කඩේ යන්නවත් නොවෙයි කියන එක. මූලාසනයේ සිටින ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, මම හිතනවා ඔබතුමා මේ යෝජනාව ගෙන ආවේත් එහෙම කාටවත් කඩේ යන බලාපොරොත්තුවෙන් නොවෙයි කියලා.

අපට මේ සභාව තුළ ගිරිය පුප්පාගෙන එළිවනකල් කෑ ගහන්න පුළුවන්. හැබැයි මතක තියා ගන්න ඕනෑ කාරණය තමයි ක්‍රිකට් කියන්නේ මේ රටේ මිනිසුන්ගේ ක්‍රීඩාවක් නොව හිතේ තියෙන ආගමක් බව. මම වොලිබෝල් සම්මේලනයේ සභාපති හැටියට ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයට ගිය එක්තරා අවුරුද්දක ජාත්‍යන්තර වොලිබෝල් සම්මේලනයේ සභාපති වුණේ බ්‍රසීලයේ මහත්මයෙක්. එතුමා කිව්වා බ්‍රසීලයේ ජාතික ක්‍රීඩාව වොලිබෝල් කියලා. මම නැඟිටලා කිව්වා, "ඒක වෙන්න බැහැ නේ, ඒ රටේ ජාතික ක්‍රීඩාව පාපන්දු නේ" කියලා. එතුමා මට කිව්වා, “No, soccer is our religion. Volleyball is our national sport” කියලා. ඒ වාගේම තමයි අද ලංකාවේ, volleyball is our national sport, but for most people, cricket is the religion; අද ක්‍රිකට් කියන්නේ අපේ රටේ සමහර අයට ආගම වාගෙයි.

Interim Committee එකක් දමන්න කියලා බෙරිහන් දෙන්න පුළුවන්. හැබැයි, Interim Committee එක දාන්න, ICC එකෙන් තහනමකුත් එන්න පුළුවන් කියලා දැනගෙන. ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා මටත් වඩා හොඳින් දන්නවා, ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව; Sri Lanka Cricket එකේ වැඩ පිළිවෙළ පිළිබඳව. FIFA එක අපේ football තහනම් කළා. ඇයි තහනම් කළේ? ක්‍රීඩා ඇමතිතුමා ගිය සුමානයේ ගත්තු ක්‍රියා මාර්ගය පසුගිය සැප්තැම්බර් මාසයේදී ගත්තා නම්, FIFA එක අපේ football තහනම් කරන්නෙත් නැහැ, ශ්‍රී රංගා හිරේ යන්නේත් නැහැ. ගරු අධිකරණ ඇමතිතුමනි, අපි අලුත් අණ පනත් ගෙනෙමු. නමුත් ඒ ගෙනෙන අණ පනත් රවුෆ් හකීම් මහත්මයා කියපු විධියට ගෙනැල්ලා හරියන්නේ නැහැ. ඒ අණ පනත් ගෙනෙනවා නම් ගෙනෙමු, ICC එකත් එක්ක පූර්ව සාකච්ඡාවකින් පසුව. එහෙම නොකර ක්‍රිකට් ban වුණොත් මොකද වෙන්නේ? ගරු විපක්ෂ නායතුමා දැන් කිව්වා මෙහිදී අර tournament ගැන, මේ tournament ගැන බලන්න ඕනෑ නැහැ කියලා. ඒවා ගැන බලන්න ඕනෑ. දැන් මේ ළඟම එන්නේ Asia Cup එක. ඊළඟට, World Cup එක එනවා. අපට Asia Cup තරගාවලියට ක්‍රීඩා කරන්න බැරි විධියට ban වුණොත්, World Cup තරගාවලියට ක්‍රීඩා කරන්න බැරි විධියට ban වුණොත් දැන් ඔය ගිරිය පුප්පාගෙන කෑ ගහන කට්ටිය ඔහොම නොවෙයි කෑ ගහන්නේ.

Sri Lanka Cricket එකේ වැරදි තිබෙනවා නම් වරදකරුවන්ට අනිවාර්යයෙන් දඬුවම් කරන්න ඕනෑ. හොඳම උදාහරණය, "හිරු" නාළිකාවට ක්‍රිකට් ක්‍රීඩාවට අදාළ මාධ්‍ය ආවරණය තහනම් කරපු එක. ඒක ෂම්මි සිල්වා මහත්මයා ගත්තු උද්දච්ච, අසාධාරණ තීන්දුවක්. ඒ නිසා ඔහු වහාම ඒ සම්බන්ධයෙන් "හිරු" නාළිකාවට කනගාටුව ප්‍රකාශ කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන් ක්‍රිකට්වල තිබෙන සියලු කුණු ටික ෂම්මි සිල්වාගේ ගිණුමට බැර කරන්නත් හොඳ නැහැ. මොකද, අවුරුදු ගාණක කුණු මේ එන්නේ.

දැන් අපි reigning Asia Cup Championsලා; අපි තමයි දැන් Asia Cup Championsලා. අපි Asia Cup එක දිනුවාම කවුරුවත් Sri Lanka Cricket එකට හොඳ කියන්නේ නැහැ. පරදින කොට කුණු ටික ඒ පැත්තට බැර කරනවා. අපි ICC Test Team Rankingsවල දැන් seventh place ඉන්නේ. එතකොට කවුරුවත් ක්‍රිකට් ආයතනයට හොඳ කියන්නේ නැහැ. 2022 විගණන වාර්තාව අනුව, අවුරුදු ගාණකට පස්සේ Sri Lanka Cricket එක විගණකයන්ට පිළිගන්න පුළුවන් වාර්තාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. එහෙම වුණත්, මේ අවුරුද්දේ හොරකම් කරලා තිබුණොත් ඒ අයට දඬුවම් කරන්න ඕනෑ. මේ audit queriesවලට උත්තර දීලා තිබෙනවා. ඒවා පිළිගත්තේ නැත්නම් COPE එක හරහා වහාම action ගන්න පුළුවන්. දැන් මේ ගරු සභාවේ ඉන්නවා COPE එකේ හිටපු සභාපති චරිත හේරත් මැතිතුමා. ඔබතුමන්ලායි, අපියි ඒ දවස්වල ආණ්ඩුව ඇතුළේ ඉඳගෙන ආණ්ඩුවේ ඇමතිවරුන්ට විරුද්ධව කෑ ගැහුවා. එහෙම කරලා ඔබතුමාට විරුද්ධ පක්ෂයට යන්නත් සිදු වුණා. ඒ ගැන ඔබතුමා දන්නවා.

ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ යෝජනාව ගෙන ආවේ ඉතා හොඳ චේතනාවකින්. හැබැයි, හොඳ චේතනාවෙන් ගෙනාපු එක බූමරංගයක් වුණොත් - backfire වුණොත් - Interim Committee එකක් දාන්න හදිසි වුණොත් ICC එකෙන් අපව තහනම් කරන්න ඉඩ තිබෙනවා, ගරු ක්‍රීඩා ඇමතිතුමනි. එතකොට තත්ත්වය මීට වඩා බරපතළ වෙනවා. අපි අලුත් ක්‍රීඩා පනත් ගෙන එමු. ගරු අධිකරණ ඇමතිතුමා කිව්වා ඊළඟ සුමානයේම ගේන්න කියලා. ඒවා ගෙනෙන්න පෙර FIFA එක සමඟත් සාකච්ඡා කළ යුතුයි. මොකද, සමස්ත ක්‍රීඩාවට මිස ක්‍රිකට්වලට විතරක් පනත් කෙටුම්පතක් ගේන්න බැහැනේ, ගරු ඇමතිතුමා? FIFA එකත් එක්ක සාකච්ඡා කළා වගේ, ICC එකත් එක්කත් සාකච්ඡා කරලා, විශේෂයෙන්ම NOC එක හරහා International Olympic Committee එක සමඟත් සාකච්ඡා කරලා ඒ පනත් ගෙනෙමු.

ක්‍රිකට් සම්බන්ධයෙන් කථා කරනකොට බොහෝ මන්ත්‍රීවරු කිව්වා, clubs 18ට විතරයි ඡන්දය පාවිච්චි කරන්න අයිතිය තිබෙන්නේ කියලා. දැන් මොකක්ද මේ වෙන්නේ? ක්‍රිකට් එක්තරා ප්‍රභූ පෙළැන්තියකට පමණයි අයිති, ඒ නිසා ඈත එපිට බදුල්ල දිස්ත්‍රික්කය නියෝජන කරන අයට මේකේ අයිතියක් නැහැ, පොළොන්නරුවට අයිතියක් නැහැ, කෑගල්ලට අයිතියක් නැහැ, අනුරාධපුරයට අයිතියක් නැහැ, කොළඹ වටේ ක්‍රිකට් ගහන